මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2015

Primary Piriven Year End Term Test - 2015

2 වසර / Grade 2

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ත්‍රිපිටක ධර්මය
Thripitaka Dharmaya

කාලය : පැය දෙකයි
Time: Two hours

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**01. කෙටි පිළිතුරු සපයන්න.**

i. සතර පෙර නිමිති නම් කරන්න.

ii. පෙර ආත්ම භාවය දකීමේ නුවණ නම් කරන්න.

iii. සත් සතියේ සිව්වන සතිය තුළ සිදු වූ විශේෂ සිදුවීම කුමක්ද ?

iv. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ මවගේ නම කුමක් ද ?

v. පෙළ පොතේ එන ජාතක කතා අතුරින් සීල පාරමිතාව ප්‍රකටවන ජාතක කතාව කුමක්ද ?

vi. ධම්ම පදය ඇතුළත් නිකාය ග්‍රන්ථය නම් කරන්න.

vii. යමක වග්ගයට අයත් ගාථා සංඛ්‍යාව කොපමණ ද ?

viii. මංගල කරුණු විමසීමට එක්තරා දිව්‍යපුත්‍රයෙක් දෙව්රම් වෙහෙරට පැමිණියේ කාගේ ඉල්ලීම මත ද?

ix. **තච පඤ්චකය** නම් කරන්න.

x. භාවනාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

**02. පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කවර අවස්ථාවක කාහට ප්‍රකාශකරන ලද්දේ ද?**

i. ''මාගේ පැතුම ඉටුවූවා සේම ඔබ වහන්සේගේ පැතුමත් ඉටුවේවා''

..............................................................................................................................

ii. ''ස්වාමිනී, දහම් අවබෝධ කිරිමට සමත් කෙලෙස් අඩු සත්වයෝ බොහෝ වෙති.''

..............................................................................................................................

iii. ''මම සියල්ල අභිබවා සිටිමි. දත යුතු සියල්ල දතිමි. කිසිදු දෙයක නොඇලී සිටිමි.''

..............................................................................................................................

iv. ''පුත නුඹේ මව ශෝකයෙන් වැළපෙන්නී ය, පැමිණ ඇයට ජීවිතය දෙන්න''

..............................................................................................................................

v. ''මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස, සුව පිණිස ලොවට අනුකම්පා පිණිස චාරිකාවේ හැසිරෙන්න''

..............................................................................................................................

(ලකුණු 3 x 5 = 15)

03. **පහත සඳහන් ප්‍රශ්නවලට ධර්මපාල ජාතක කතාව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

i. ධර්මපාල ගම්වැසියන් රකින සීලය කුමක් ද?

ii. ධර්මපාල කුමරු මිය ගිය බව අසා ගම්වැසියන් කුමක් කළේ ද?

iii. එසමයෙහි ධර්මපාල කුමරුගේ දෙමාපියන් මෙසමයෙහි කවුරුන් ද?

iv. **"ධම්මො හවෙ රක්ඛති ධම්මචාරි"** යන ගාථා පාඨයෙහි අර්ථය ලියන්න.

v. ධර්මපාල ජාතකය අවසානයේ සුද්ධෝදන රජතුමා ලැබූ මාර්ගඵලය කුමක්ද ?

(ලකුණු 2 x 5 = 10)

04. i. පහත සඳහන් ගාථාවලින් දෙකක් සම්පූර්ණ කරන්න.

i. මනො පුබ්බංගමා ධම්මා...........

ii. අප්පමාදො අමත පදං...........

iii. ඉධ මොදති පෙච්ච මොදති............

iv. එතං විසෙසතො ඤත්වා...........

(ලකුණු 4 x 2 = 08)

ii. ඉන් එක් ගාථාවක නිදාන කතාව කෙටියෙන් ලියන්න. (ලකුණු 07 )

05. i. බුදුරජාණන් වහන්සේට පෙර පැවැති මංගල යැයි සම්මත කර ගත් කරුණු තුන මොනවා ද?

(ලකුණු 03)

ii. මංගල කරුණු තිස් අට අතුරින් ශිෂ්‍යයකු වශයෙන් ඔබගේ ජීවිතයට ආදර්ශ කරගත හැකි මංගල කරුණු හතක් ලියන්න. (ලකුණු 07)

06. i. භික්ෂූන් වහන්සේ නමක් ගමේ හැසිරීමේ දී පිළිපැදිය යුතු ආචාර ධර්ම ගැන කියැවෙන සේඛියා පහක් පාලියෙන් ලියන්න.

(ලකුණු 05)

ii. එම සේඛියා පහේ සිංහල අදහස ලියන්න. (ලකුණු 05)

07. i.භාවනා ක්‍රම තුනක් දක්වන්න. (ලකුණු 03)

ii. සිහි කල්පනාවෙන් වැඩ කිරීමට භාවනාව යොදා ගන්නා ආකාරය විස්තර කරන්න.

(ලකුණු 07)

08. i. ආනන්ද හිමියන් අග්‍ර උපස්ථායක තනතුර භාරගැනීමේදී ඉදිරිපත් කළ වර අටෙන් ඉල්ලීම් **හතර** ලියන්න. (ලකුණු 04)

ii. ආනන්ද හිමිගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ පහදන්න. (ලකුණු 06)